# ගෝලීයකරණයේ උපදේශකයින් තමන්ට වැරදුණු බව යළිත් පිළිගනී

**- IMF ප්‍රධානියාගේ ප්‍රකාශය**

පසුගිය වසර 30 තුළ ලෝක ආර්ථිකය මෙහෙයවූ සහ ඊට මඟ පෙන්වූ ලිබරල්වාදී න්‍යායයන් මුළුමනින්ම වෙනස් කළ යුතු බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානියා වන ඩොමිනික් ස්ට්‍රෝස් ඛාන් (Dominique Strauss - Kahn) ප්‍රකාශ කලේ ය.

වොෂින්ටන් හී ශිෂ්‍යයින් අමතා පසුගිය සඳුදා (2011 අප්‍රේල් 04) දේශනයක් පැවැත්වූ ස්ට්‍රෝස් කියා සිටියේ වොෂින්ටන් එකඟතාව (Washington Consensus) - (විවෘත ආර්ථිකය කාර්යක්ෂම ය යන මතය ප්‍රකාශ කරන ආර්ථික න්‍යාය) කට්ටලය දැන් යල් පැනගොස් ඇති බව ය. IMF විසින් බොහෝ කලක් තම උද්ඝෝෂකයා ලෙස පිළිගෙන සිටි ස්ට්‍රෝස් ගේ මේ ප්‍රකාශය ම IMF (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) කම්පනය කරවීමට සමත් විය.

''අලුත් ලෝකයක් සඳහා සාර්ව ආර්ථික රාමුවක් සැලසුම් කිරීමේ දී ඔරලෝසු බට්ටා යම් තරමකට හෝ අනෙක් පැත්තට පැද්දී ඇති බව පිළිගත යුතුය.'' - එනම් වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්තියේ සිට රාජ්‍යය දෙසට පැද්දී ඇති බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බොහෝ කලක් තිස්සේ විවෘත (නිදහස්) වෙළෙඳපොළ ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටි එය තහවුරු කළ ආයතනයකි. IMF ආයතනය එහි සාමාජිකත්වය දැරූ රටවලට රාජ්‍ය මගින් පවත්වාගෙන ගිය කර්මාන්ත පෞද්ගලීකරණය කරන ලෙස හා වෙළෙඳ ව්‍යාපාර පාලනය කිරීම සඳහා වන නීති ලිහිල් කරන ලෙස උපදෙස් දුනි.

''මා වරදවා තේරුම් ගන්න එපා පැරණි පන්නයේ ගෝලීයකරණය විසින් බොහෝ ප්‍රතිඵල ලබාදී තිබෙනවා. ඒ මගින් කෝටිගණන් ජනතාව දුප්පත් කමින් ඉහළට ඔසවා තිබෙනවා'' යි ඔහු කියා සිටියේ ය.

''එහෙත් මෙම ගෝලීයකරණයේ අඳුරු පැත්තක් තිබුනා ඒ මගින් දුප්පතුන් හා පොහොසතුන් අතර විශාල පරතරයක් ගොඩනැගුවා, එය වඩ වඩාත් විශාල වුනා. වෙළෙඳපොළ ගෝලීයකරණය තුලින් වඩා අඩු අසමානතාවයක් ඇති කළ අතර, මූල්‍ය ගෝලීයකරණය විසින් එය වඩාත් වැඩි කළා. මෑත අවුරුදු වල කතාන්තරය එයයි.''

ස්ට්‍රොස් ඛාන් (Strauss Kahn) බොහෝ අය හිතන විදිහට තම නිලයෙන් කෙටි කලකදීම ඉවත් වී 2012 ජනාධිපතිවරණයේ දී ප්‍රංශ සමාජවාදී පක්ෂයේ නායකත්වය භාර ගන්නේ යැයි අපේක්ෂිතය.

''දිගුකාලීනව තිරසර වර්ධනය වඩාත් සම්බන්ධවන්නේ වඩා සමාන ආදායම් බෙදීයාමක් සමගයි. අලුත් ගෝලීය යහපාලනය විසින් සමාජ පෑහීම් (ඒකාබද්ධතාවය) ගැන වැඩි අවධානයක් යොමු කළ යුතුය.'' ඔහු කියා සිටියේ සමාජ ඒකාබද්ධතාවය හා වඩා තද නීති අවශ්‍යව ඇති බවයි.

''මෙම ක්ෂේත්‍රයට, එහි ඇති අවදානම් ගැනීමේ හැසිරීම නිසා ඇතිවන සමාජයීය හානි හා වැය දැරීමට හැකිවනු පිණිස මූල්‍ය කටයුතු වලදී බද්දක් පැනවිය යුතුය.'' යි ඔහු කීය.

**Yahoo/ News**

මෙය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බෙහෙවින් වැදගත් වන ප්‍රකාශයකි. ඊට හේතුව ශ්‍රී ලංකාව ඉහත කී මූල්‍ය ආයතනවල උපදෙස් අනුව 1977 සිට මුළුමනින්ම විවෘත වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්ති කරා මාරුවූ රටක් වීමයි. 1948 නිදහස ලැබූ දිනවල සිට සමාජ සුබසාධනය, ආදායම් හා සමාජ විෂමතා අඩුමට්ටමක තබාගැනීම දුප්පත්කම අඩුකිරීම වැනි ප්‍රතිපත්ති අනුගමනය කොට, යහපත් සමාජ සංවර්ධන ප්‍රතිඵල ලබාගත් රටක් වූ ශ්‍රී ලංකාව 1977 සිට එම ප්‍රතිපත්ති මුළුමනින් වෙනස් කොට, පෞද්ගලීකරණය, අපනයනය කරා යොමුවීම හා වෙළෙඳපොළ පාලනය කිරීම ලිහිල් කිරීම වැනි ප්‍රතිපත්ති කරා මාරු විය. 1977 සිට 1994 දක්වා එ.ජා.ප ය

එම ප්‍රතිපත්ති මුළුමනින්ම අනුගමනය කළ අතර, 1994 දී බලයට පත් චන්ද්‍රිකා බණ්ඩාරනායක ආණ්ඩුව ඊට විරුද්ධ ප්‍රතිපත්ති ප්‍රකාශ කරමින් බලයට පත්වූ නමුදු දිගටම අනුගමනය කළේ ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, දේශීය හා විදේශීය පෞද්ගලික ව්‍යාපාර අංශය විසින් ඉල්ලා සිටි වෙළෙඳපොළ ගෝලීයකරණය හා මූල්‍ය ගෝලීයකරණ ප්‍රතිපත්ති සමූහයකි. රාජ්‍ය සතුව තිබූ සියලු කර්මාන්ත හා ව්‍යවසායන් පෞද්ගලීකරණය කරන ලදී. අධ්‍යාපනය, සෞඛ්‍යය ආදී සමාජ සේවාවන් අධික මුදල් අයකරන පෞද්ගලික සේවාවන් බවට පත් කෙරින. මේ වොෂින්ටන් සම්මුතියේ (Washington Consensus) උපදෙස් මාලාව විය. රට තුල ආදායම් විෂමතාවයන් බෙහෙවින් වර්ධනය විය. සමාජ ගැටුම් හා කැරලිකාරීත්වයන් වර්ධනය විය. තරුණයින් දසදහස් ගණනින් මරා දමන ලදී. කම්කරු ව්‍යාපාර, ගොවි ව්‍යාපාර මර්දනය කෙරිණි. අත්පත් කරගත් ප්‍රතිඵල කිසිවක් නැති තරම්ය. දේශීය හා විදේශීය ව්‍යාපාරිකයින් ලාභ තරකොට ගත්හ. ඒ ලාභ බදු ගෙවීම් වලින් තොරව රටින් පිට ගෙන ගියහ. රට අතිවිශාල ලෙස ණයගැති විය. තව තවත් ණය ගනිමින් මෙම ව්‍යාපාරිකයින් ගෙන්වා ගැනීම සඳහා ඔවුනට සහන හා පහසුකම් සැලසූහ.

ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික උපදේශකයාව සිටි ජෝශප් ස්ටිග්ලිට්ස් (Joseph Stiglitz) සිය ප්‍රතිපත්ති වැරදි බව පිළිගත් අතර ඔහු ඉල්ලා අස්විය.

ලෝක බැංකුවේ හිටපු සභාපති ජේම්ස් වුල්ෆන්සන් (James Wolfensohn), 1997 ඇති වූ නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයේදී - එම ලෝක බැංකු පිළිවෙත වෙනස් විය යුතු බවත්, ඒ, ඒ, රටවලට තම ප්‍රතිපත්ති සකසා ගැනීමට ඉඩ දිය යුතු බවත් ප්‍රකාශ කළේය.

නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය ආරම්භ කළ ව්‍යාපාරිකයා වන ජෝර්ජ් සෝරොස් ගෝලීයකරණය වැරදි බව ප්‍රකාශ කළේය.

2008-2009 ඇතිවූ ලෝක මූල්‍ය අර්බුදය ගැන සිතාබලන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නායක ඩොමිනික් ස්ට්‍රෝස් ඛාන් (Dominique Strauss - Kahn) නැවතත් වෙළෙඳ හා මූල්‍ය ගෝලීයකරණයෙන් උග්‍රවූ ලෝක සමාජ අර්බුදය පෙන්වා දෙමින් වොෂින්ටන් සම්මුතිය, එනම් පෞද්ගලීකරණය, වෙළෙඳපොළ විවෘතකරණය හා මූල්‍ය පාලනයන් ලිහිල් කිරීම වැරදි බව පිළිගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ද මෙම අර්බුදය උග්‍ර වී ආණ්ඩු කඩා වැටෙද්දී ඊට එරෙහි ''මහින්ද චින්තනය'' වැනි ප්‍රතිපත්ති ප්‍රකාශ කොට බලයට පත්වූ පාලකයින්ට ද සිදුවූයේ එම වෙළෙඳපොළ ප්‍රතිපත්ති, අපනයන ප්‍රතිපත්ති, පෞද්ගලීකරණය ප්‍රතිපත්ති වල පිහිට නොව, ජනතාවගේ ශක්තිය හා නිර්මාණාත්මකභාවයන් සොබාදහමේ දායාදයනුත් කෙරෙහි විශ්වාසය තබන ''අපි වවමු, රට නගමු, ගම නැගුම, දිවි නැගුම'' ආදී සැලසුම් ප්‍රකාශ කරමින් බලය රැකගැනීමටය.

දැන්වත් මේ 33 වසරක විනාශකාරී මාවතින් ඉවත්ව යහපත් සිහිබුද්ධියෙන් යුතුව, ජනතාවට සවන්දීමට කාලය එළැඹ ඇති බව වටහා ගත යුතු නොවේද?

**සරත් ප්‍රනාන්දු**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**